| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.05.28 පැය 0745 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1087/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**නාරාහේන්පිට පොලිස් වසමේ සිදු වූ වෙඩි තැබීමකට සම්බන්ධ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - කොළඹ දිසා අපරාධ කොට්ඨාසය.**

2025.05.17 වන දින නාරාහේන්පිට පොලිස් වසමේදී යතුරුපැදියකින් පැමිණි නාඳුනන පුද්ගලයන් දෙදෙනෙකු විසින් තුසිත හල්ලොලුව නැමැති අය හා තවත් පුද්ගලයෙකු ගමන් කරමින් සිටි ජීප් රථයකට සිදු කළ වෙඩි තැබීමක් සම්බන්ධයෙන් නාරාහේන්පිට පොලිසිය හා කොළඹ දිසා අපරාධ කොට්ඨාසය මගින් විමශර්න සිදු කරමින් පවතී.

2025.05.27 වන දින වත්තල හා කිරුළපන ප්‍රදේශවලදී කොළඹ දිසා අපරාධ කොට්ඨාස නිලධාරීන් විසින් මෙම වෙඩි තැබීමට පැමිණි යතුරු පැදියේ පැදිකරු හා එම අපරාධයට අධාර අනුබල දුන් සැකකරුවන් දෙදෙනෙකු ජංගම දුරකථන 04 ක් ද සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 31, 32 හා 40 වයස්වල පසුවන වත්තල හා කොළඹ 14 ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

සැකකුරුවන් 2025.05.28 වන අද දින කොළඹ ගරු ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය. නාරාහේන්පිට පොලිසිය හා කොළඹ දිසා අපරාධ කොට්ඨාසය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**